# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2188/3 – 2020 අගෝස්තු මස 10 වැනි සඳුදා – 2020.08.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනත** අංක 01

ඌව වෙල්ලස්ස, කොටබෝව, කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2020

ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ 2020 වාර්ෂික ඇසළ උත්සවය 2020.08.18 වැනි දින කප් සිටුවීමෙන් ආරම්භ වී 2020.09.02 වැනි දින අලුයම දිය කැපීමේ මංගල්‍යයෙන් නිමාවට පත්වන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව 1964 ජූලි 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

**ගුණදාස සමරසිංහ,**
මොණරාගල දිස්ත්‍රික් ලේකම් / දිසාපති සහ
කොටබෝව කුඩා කතරගම
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2020 අගෝස්තු මස 05 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A – G 32635 – 18 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2020** අංක 02

1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ කොටබෝව වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. **කඳවුරු ප්‍රදේශය :**

කොටබෝවේ ''දහමල් ඔය'' නැමති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භය ඇතුළත ප්‍රදේශය ඇතුළත් වේ.

02. **ගොඩනැගිලි ඉදිකිරීම් :**

මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් හෝ 2020.08.18 වැනි දින සිට 2020.09.02 වැනි දින දක්වා කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළෙඳසැලක් ඉදි නොකළ යුතුය.

03. **යාචකයෝ :**

පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනක දී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදා දීම ද නොකළ යුතුය.

04. **නෑම සහ සේදීම :**

කොටබෝවේ ''දහමල් ඔය'' නැමති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භය ඇතුළත ප්‍රදේශය තුළ කිසිවෙකු විසින් දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම හෝ වාහන සේදීම නොකළ යුතුය.

05. වාහන :

05.01. මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසරයක් රහිතව මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (දහමල් ඔයෙන් නැගෙනහිරට) පැදවීම හෝ ඇතුලු කිරීම නොකළ යුතුය.

05.02. කඳවුරට අයත් කඩබිම් ප්‍රදේශයේ වාහන නතර කිරීමට වෙන්කර ඇති රිය ගාල්වල හැර අන් කිසිඳු ස්ථානයක වාහනයක් නතර කර නොතැබිය යුතුය.

06. **කාවාඩි කඩ :**

මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවෙකු විසින් කාවාඩි කඩ පිහිටවනු නොලැබිය යුතුය.

07. **වෙළඳාම :**

07.01. මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයකින් තොරව කඳවුරු භූමිය තුළ තාවකාලිකව කඩ බදු දීම හෝ වෙන්දේසි කිරීම නොකළ යුතුය. තව ද මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ප්‍රදේශය තුළ නියම නොකරන ලද ස්ථානයක එවැනි කටයුතු සිදු කිරීම කිසිවෙකු විසින් නොකළ යුතුය.

07.02. පූජා පෙදෙස, මඟී පාලමෙහි මාර්ගය හා කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුර අයුතු ලෙස ආක්‍රමණය කරන පරිදි යම් මඩුවක් තැනීම හෝ යම් ඉදිකිරීමක් කිරීම හෝ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් විශාල කිරීමක් නොකළ යුතුය. එකී ප්‍රදේශයන් හි සංචාරක වෙළෙඳාම ද තහනම්ය.

07.03. මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළෙඳාම් නොකළ යුතුය.

07.04. යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් ගෙනයාමේ කාර්යය සඳහා සෑම ගොඩනැගිල්ලක, ඉදිකිරීමක හෝ ස්ථානයකම ප්‍රමාණයෙන් ඝණ අඩි 04 1/2කට අඩු නොවන කුණු බාල්දියක් සපයා තිබිය යුතුය. කුණු බාල්දියට කුණු දමන විට හා ඉන් ඒවා ඉවත් කරන විට හැර අන් සෑම විටම කුණු බාල්දිය පියනකින් වසා තැබිය යුතුය. තව ද සෞඛ්‍ය කම්කරුවන් විසින් කුණු ඉවත ගෙන යෑම සඳහා නියම කරනු ලැබූ වේලාවන්හි දී ඒ භාජන ඒ ස්ථානවල පිටතින් තැබිය යුතුය.

07.05. විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාරපාන ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂාවන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතුය.

08. **සනීපාරක්ෂාව සහ මහජන සෞඛ්‍ය :**

ඒ කාර්යය සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් මළ මුත්‍ර පහ නොකළ යුතු අතර, සලසා ඇති ස්ථානයක හෝ භාජනයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් ද්‍රව හෝ ඝණ කුණුකසළ කිසිවක් නොදැමිය යුතුය.

මවිසින් දෙන ලද මෙම ආඥාවන් කිසිම තැනැත්තකු විසින් කඩ නොකළ යුතුය.

**ගුණදාස සමරසිංහ,**
මොණරාගල දිස්ත්‍රික් ලේකම් / දිසාපති සහ කොටබෝව කුඩා කතරගම
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරි.

2020 අගෝස්තු මස 05 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

08 - 517

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.